**කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 14 - 2023**

**-----------------------------------------------------------------------**

## 1. විගණන මතය

1.1 කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 14 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 14 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 14 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂ පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | කාරක සභාව/කාරකසභා | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | යටියන්තොට | දිස්ත්‍රික් කාර්යාලය වෙත ප්‍රේෂණය කළ යුතු රු.787,648 ක සහනාධාර පොහොර විකුණුම් ආදායම, කමිටුවේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර දිස්ත්‍රික් කාර්යාලය වෙත ප්‍රේෂණය කළ සහනාධාර පොහොර විකුණුම් රු.338,958 ක් කමිටුවේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවදුරටත් ගෙවිය යුතුව පැවති රු.448,690 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | ගිණුම් නිවැරදි විය යුතුය. |
| (ආ) | අඹේපුස්ස | ගොයම් කපන යන්ත්‍රයක් සහ රෝද 04 ට්‍රැක්ටරයක් සහ ටේලරයක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ආපසු භාර දී තිබුණි. එහෙත්, එම වත්කම් වෙනුවෙන් එම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලද පසු නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.777,568 ක් මෙම වාර්තාවේ දිනය දක්වාම ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | | |
| (ඈ) | දැදිගම | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු රු.221,393 ක සහනාධාර පොහොර විකුණුම් ආදායම, කමිටුවේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එම වරද ඉදිරි ගිණුම් වාර්තාවෙන් නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | - එම - |
| (ඇ) | පින්නවල | එකතු වටිනාකම රු.158,113 ක් වූ ණයහිමි ශේෂ 3 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් අත්හැරී තිබුණි | එම වරද ඉදිරියේදී නිවැරදි කිරීමට පියවර ගන්නා බව | - එම - |
| (ඉ) | පින්නවල | ගෙවිය යුතු රු.243,034 ක වක්‍රීය අරමුදල් ශේෂය, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි ගොවි බැංකු නියමු ව්‍යාපෘතියට ගැලපීම වෙනුවට සභාවේ සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියට ගැලපීමට කටයුතු කරන බව. | - එම - |
| (ඊ) | පරගම්මන | භෞතිකව නොපවතින නමුත් රු. 475,432 ක් වූ ගෙවියයුතු ට්‍රැක්ටර් හා කෘෂි උපකරණ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් දැනුවත් කර ඉදිරි පියවර ගන්නා බව. | - එම - |
| (උ) | රුවන්වැල්ල, පින්නවල, දැලිවල, උස්සාපිටිය බටුවත්ත | වටිනාකම රු.38,734,863 ක් වූ ජර්නල් සටහන් 146 ක් සඳහා අනුමැතියක් නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ජර්නල් සටහන් සඳහා අනුමැතිය ලබාගත යුතුය. |

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| බටුවත්ත, පනාවල | ගිණුම් විෂයයන් 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා අනුරූපී වාර්තා අනුව එම ශේෂය අතර රු.630,458 ක වෙනසක් පැවැතිණි. | රු. 443,351 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. ඉතිරි ශේෂය බිල්පතක් නිකුත් නොකර මුදල් බැංකුගත කිරීම නිසා සිදු වූවක් බව. | නොසැසඳීම් සැසඳිය යුතුය. |

### 1.3.3 අවිනිශ්චිත ගිණුම්

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| යටිටෝගොඩ උස්සාපිටිය දැලිවල | වර්ෂ 06 ක සිට වර්ෂ 13ක් අතර කාලයක් තුළ ගිණුම් විෂයයන් 04ක පැවැති රු.2,757,982 ක අවිනිශ්චිත ශේෂ නිරවුල් කර නොතිබුණි. | නැවත ගිණුම් පිළියෙල කර නිරවුල් කරන බව. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |

### 1.4 නීති,රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | කාරක සභාව/ කාරක සභා | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | රුවන්වැල්ල, පරගම්මන, දැරණියගල, යටියන්තොට, දැලිවල, බටුවත්ත, පනාවල, අඹේපුස්ස දැදිගම, බැම්ණිවත්ත පින්නවල, | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත 52(1) වගන්තිය | සෑම වගා කන්නයකටම පෙර බල ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කරනු ලබන බව. | පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අරණායක යටිටෝගොඩ, උස්සාපිටිය | | | | |
| (ආ) | රුවන්වැල්ල, යටිටෝගොඩ යටියන්තොට, දැලිවල, බටුවත්ත, දැදිගම, අඹේපුස්ස, බැමිණිවත්ත, දැරණිගල, උස්සාපිටිය, අරණායක | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ චක්‍රලේඛය | දීර්ඝ කාලයක සිට පැවැත එන 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කාමර කුලී රු.1,178,939ක් විය. | තොරතුරු සොයාගත නොහැකි වීම නිසා අයකරගත නොහැකි බව . | චක්‍රලේඛය අනුව අයකර ගත යුතුය. |
| (ඇ) | අඹේපුස්ස, උස්සාපිටිය බැමිණිවත්ත, පනාවල යටියන්තොට, යටිටෝගොඩ දැරණියගල, පරගම්මන රුවන්වැල්ල, පින්නවල බටුවත්ත, දැදිගම දැලිවල, අරණායක | 2020 ජූනි 25 දිනැති අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | ඇප තැබිය යුතු නිලධාරීන් 318 දෙනෙකු විසින් ඇප තැබීම් සිදුකර නොතිබුණි. | අවශ්‍ය උපදෙස් ලද පසු අදාළ චක්‍රලේඛය පරිදි ඉදිරියේදී කටයුතු කරන බව . | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | රුවන්වැල්ල, පරගම්මන, දැරණියගල, යටියන්තොට, දැලිවල, බටුවත්ත, පනාවල, අඹේපුස්ස දැදිගම, බැමිණිවත්ත පින්නවල, අරණායක යටිටෝගොඩ, උස්සාපිටිය | ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 සහ 2012 පෙබරවාරි 29 දිනැති චක්‍රලේඛයේ 5.6 (i) ඡේදය | ගොවිජන බැංකු ගිණුම්, ගොවිජන කාරක සභාවේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛ අනුව ගිණුම් පිළියෙල කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඉ) | දැදිගම පින්නවල අරණායක උස්සාපිටිය | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 30 (2) ඡේදය | එකතුව රු.2,735,242 ක් වූ ණයහිමි ශේෂ 36 ක් සඳහා සනාථ කිරීම් නොතිබුණි. | පැරණි ශේෂ සොයා කටයුතු කරන බව. | ශේෂ තහවුරු කිරිමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2012 පෙබරවාරි 29 දිනැති 2012/04 චක්‍රලේඛය හා 2020/10/08 දිනැති අංක 09/2020 චක්‍රලේඛය | | | |
| (i) | යටිටෝගොඩ, උස්සාපිටිය, පනාවල, දැදිගම, පින්නවල, අඹේපුස්ස, දැලිවල, යටියන්තොට | 3.2 (vii) ඡේදය | ණය නිකුත් කිරීමේ කොන්දේසි වලට පටහැනිව ණය ලබා ගැනීමට ආසන්න අවස්ථාවේ ගිණුම් විවෘත කළ සාමාජිකයින් 85දෙනෙකුට එකතුව රු.5,475,000 ක ණය මුදලක් ලබා දී තිබුණි. | මින් ඉදිරියට චක්‍රලේඛයට අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය. |
| (ii) | යටිටෝගොඩ උස්සාපිටිය පින්නවල දැලිවල යටියන්තොට අරණායක පනාවල | 3.2 (viii) ඡේදය 3.2 (ix) ඡේදය | ණය නිර්දේශ කරන දිනවනවිට නියමිත කොටස් හෝ කුඩා කණ්ඩායම් ශේෂ අසම්පූර්ණ ණයකරුවන් 67 දෙනෙකු හට එකතුව රු.8,625,000 ක ණය මුදලක් නිකුත් කර තිබුණි. | මින් ඉදිරියට චක්‍රලේඛයට අනුව කටයුතු කරන බව. | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | පනාවල උස්සාපිටිය | 3.3 (ii) ඡේදය | කුඩා කණ්ඩායමක සාමාජිකයෙකු නොවන ණය ඉල්ලුම්කරුවෙකු හට ණය ලබා දීමේදී ඉල්ලුම්කරුගේ නමින් පැවතිය යුතු අවම තැන්පත් ශේෂය නොතිබියදී ඉල්ලුම්කරුවන් 6 දෙනෙකුට එකතුව රු.600,000 ක ණය මුදලක් ලබා දී තිබුණි. | මින් ඉදිරියට චක්‍රලේඛයට අනුව කටයුතු කරන බව. | - එම - |
| (iv) | යට්ටෝගොඩ උස්සාපිටිය දැදිගම අඹේපුස්ස බැම්ණිවත්ත | 3.8 (v) ඡේදය | ව්‍යාපෘති ණය ලබාගත හැක්කේ ගොවි පවුලකින් එක් සාමාජිකයෙකුට පමණක් වුවද ඊට පටහැනිව එකම පවුලේ සාමාජිකයන් හට අවස්ථා 20 ක දී එකතුව රු.5,750,000 ක ණය ලබා දී තිබුණි. | මින් ඉදිරියට චක්‍රලේඛයට අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 14 හි ශුද්ධ මෙහෙයුම් වර්ධනය රු.9,548,298 ක් විය. පසුගිය වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 13 ක ශුද්ධ මෙහෙයුම් වර්ධනය රු. 8,934,540 ක් ද එක් කාරක සභාවක ශුද්ධ මෙහෙයුම් පිරිහීම රු.349,574 ක් ද විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අක්‍රීය බැංකු ගිණුම්

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| රුවන්වැල්ල<br>අඹේපුස්ස<br>පනාවල<br>පරගම්මන | කාරක සභා 02 ක රු.153,684 ක ශේෂ සහිත ජංගම ගිණුම් 2 ක් හා කාරක සභා 2ක රු.21,923 ක ශේෂ සහිත ඉතිරිකිරීමේ ගිණුම් 2 ක් අක්‍රීයව පැවතුණි. | අනවශ්‍ය ගිණුම් වසා දැමීමටත් අනෙක් ගිණුම් සක්‍රීයව පවත්වාගෙන යාමටත් කටයුතු කරන බව. | බැංකු ගිණුම් සක්‍රීයව පවත්වාගෙන යා යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | උස්සාපිටිය<br>පින්නවල<br>දැදිගම<br>යටියන්තොට<br>අරණායක<br>බැමිණිවත්ත | කාරක සභා 04 ක සිතමු කාන්තා ගොවි සංවිධාන 114 ක් ද, කාරක සභා 03 ක ගොවි සංවිධාන 92 ක් ද, එක් කාරක සභාවක කාන්තා ගොවි සංවිධාන 35 ක් ද අක්‍රීයව පැවතුණි. | උපදෙස් ලබාගෙන දුර්වල සමිති ඈවර කිරීමටත්, කාන්තා සමිති සක්‍රීය කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇති බව. | සියලු සමිති සක්‍රීයව පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | අඹේපුස්ස, පරගම්මන, යටිටෝගොඩ, පින්නවල, පනාවල, දැදිගම, උස්සාපිටිය, බටුවත්ත, දැලිවල, අරණායක, දැරණියගල | ණයලාභීන් 3214 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂය රු.107,678,155 ක් වූ අතර එම ශේෂය තුළ කිසිඳු වාරිකයක් නොගෙවූ ණයලාභීන් 280 දෙනෙකුගෙන් රු.20,510,000 ක් අයවිය යුතුව පැවැතිණි. | හිඟ ණය අයකර ගැනීමට සැලසුම් සකස් කිරීම, ණයගැතියන් හා නිලධාරීන් දැනුවත් කිරීම, ශේෂ කපාහැරීමට උපදෙස් ඉල්ලීම, නඩු පැවරීමට කටයුතු කිරීම ආදී කටයුතු කර ඇති බව. | හිඟ හිටි ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පනාවල උස්සාපිටිය දැදිගම බටුවත්ත අඹේපුස්ස යටියන්තොට අරණායක | ගොවිජන බැංකුව මඟින් ආරම්භ කර පවත්වාගෙන යන ලද සිතමු කාන්තා තැන්පත් ගිණුම් 09 ක්, පෙරමඟ ළමා ගිණුම් 1335 ක් හා සාමාන්‍ය තැන්පත් ගිණුම් 7713 ක්, කුඩා කණ්ඩායම් තැන්පත් ගිණුම් 88 ක් හා කාන්තා ඉතුරුම් ගිණුම් 62 ක් , කාන්තා ගොවි සංවිධාන ගිණුම් 37 ක් ආරම්භ තැන්පතුවට පමණක් සීමා වූ අක්‍රීය ගිණුම් විය. | මේ සම්බන්ධයෙන් කෘ.ප.නි.ස නිලධාරීන්ට ඉලක්ක ලබා දී ඇත. එම ඉලක්ක අත්පත් කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා පසුවිපරම් සිදුකරන බව. | ගොවිජන බැංකුවේ පවත්වාගෙන යන විවිධ තැන්පත් ගිණුම් සක්‍රීයව පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | අරණායක | අදියර වශයෙන් නිකුත් කළ යුතු සෞභාග්‍ය සාර භූමි ණය රු.2,200,000ක මුළු ණය මුදලම එක්වර නිකුත් කර තිබුණි. එම ණය වර්ෂ 02ක් තුළ ගෙවා නිම කළ යුතු වුවද, එම කාලය ඉකුත් වූ නොපියවූ රු.2,039,504ක ණය ශේෂයක් පැවතිණි. | 2021 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන ගොවීන් වෙත මෙම ණය නිදහස් කර ඇති බව. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | බැම්බිණිවත්ත දැලිවල බටුවත්ත අඹේපුස්ස උස්සාපිටිය යටියන්තොට අරණායක රුවන්වැල්ල | දීර්ඝ කාලයක සිට අයකර ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.11,576,990 ක් වූ ණයගැති ශේෂ 186 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිට අයකර ගැනීමටත් එකතුව රු.8,779,705 ක් | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ උපදෙස් ලද පසු නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ණයගැති ශේෂ අයකර ගැනීමටත් ණයහිමි ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | දැරණියගල<br>පනාවල<br>පින්නවල<br>යටිටෝගොඩ<br>දැදිගම<br>පරගම්මන | වූ ණයහිමි ශේෂ 199 ක් නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | රුවන්වැල්ල අරණායක බැම්ණිවත්ත පින්නවල | විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘෂිකර්ම පර්යේෂන නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස.) නිලධාරීන් වෙත ලබා දෙන භාණ්ඩවලට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරීන් 44 දෙනෙකුගෙන් රු.2,359,355 ක් ලැබිය යුතුව පැවතිණි. | එම නිලධාරීන්ව සති රැස්වීමේදී හා ලිපි මඟින් දැනුවත් කර ඇත. ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | විකුණා මුදල් ගෙවීමේ පදනම මත ලබාදෙන භාණ්ඩ සඳහා අදාළ කාලය තුල දී මුදල් අයකරගත යුතුය. |
| (ඇ) | යටියන්තොට | යුධ හමුදාව විසින් 1992 වර්ෂයේදී රැගෙන ගිය පිරිවැය රු.978,173 ක් වූ ට්‍රැක්ටරයක් හා ටේලරයක් ආපසු ලබා ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව තොරතුරක් සොයා ගත නොහැකි නිසා ගිණුම්වලින් ඉවත් කිරීමට නොහැකි වී ඇති බව. | අදාළ වත්කම් ආපසු ලබා ගැනීමට පියවරගත යුතු වේ. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | කාරක සභාව/<br>කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ<br>අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අරණායක | 2021 වර්ෂයේ ඉදිකළ පිරිවැය රු.256,000 ක් වූ “පොලිටනලය” සහ “සෙවන ගෘහය” විගණිත දින වූ 2023 අප්‍රේල් 21 දින වනවිට ඌන උපයෝජිතව පැවතුණි. | ඒ තුළ වගා කිරීමට කටයුතු කරන බව. | වත්කම් ඌන උපයෝජිතව නොතැබිය යුතුය. |
| (ආ) | අරණායක | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා 2021 වර්ෂයේ රු.130,000කට මිල දී ගත් කොළ කැබලි කිරීමේ යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබුණි. | කාබනික පොහොර වැඩසටහන් ක්‍රියාත්මක නොවීම හා ඒ පිළිබඳ ගොවීන්ගේ උනන්දුව අඩුවීම කැබලිකිරීමේ යන්ත්‍රය භාවිතාවීම | - එම -. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අවම වීමට හේතු වී ඇති බව. | |
| (ඇ) | අරණායක උස්සාපිටිය | 2014 වර්ෂයේ මිලදී ගෙන තිබූ ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීමේ යන්ත්‍රය අභාවිතව පැවතුණි. | මෙතෙක් එම යන්ත්‍රය භාවිතා නොකළ අතර,ඉදිරියේදී භාවිතයට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | දැදිගම | සති පොළ පැවැත්වීම සඳහා මධ්‍යස්ථාන භූමියේ ඉදිකර තිබුණු ගොඩනැගිල්ල වර්ෂ 03ක පමණ කාලයක සිට අභාවිතව පැවතුණි. | ගොවින්ගේ පැමිණීම අඩු නිසා වෙළඳුන් මෙහි භාණ්ඩ අලෙවියට පැමිණිම ප්‍රතික්ෂේප කර තිබූ බව. | - එම - |
| (ඉ) | දැලිවල | කුබෝටා රෝද 4 ට්‍රැක්ටරය, ටේලර් 02ක්, වීඩරය, ගොයම් කපන යන්ත්‍රය හා කොළ මඩින යන්ත්‍රය ඌන උපයෝජිතව පැවතුණි. | මෙම යන්ත්‍ර වෙන්දේසි කිරීමටත්, ප්‍රයෝජනයට ගත හැකි යන්ත්‍ර අළුත්වැඩියාකිරීමටත් කටයුතු කරන බව. | - එම - |
| (ඊ) | රුවන්වැල්ල | 2 KR ව්‍යාපෘතිය යටතේ 2012 පෙබරවාරි මාසයේදී ලද රු.650,000 ක රෝද හතරේ ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් හා නගුලක් කුඹුරුවල සී සෑමට නොහැකි තත්ත්වයේ ට්‍රැක්ටරයක් වීමෙන් භාවිතයට ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා සහකාර කොමසාරිස්තුමා වෙත යොමුකිරීමට කටයුතු කරන බව. | - එම -. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| කාරක සභාව/ කාරක සභා | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| බැම්ණිවත්ත, දැලිවල, බටුවත්ත, අඹේපුස්ස, උස්සාපිටිය, යටියන්තොට, අරණායක, රුවන්වැල්ල, දැරණියගල, පනාවල, පින්නවල, යටටෝගොඩ, දැදිගම, පරගම්මන, | දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය නිලධාරි තනතුරු 4 ක් හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරු 173 ක් 2023 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි. | රජය මඟින් මෙතෙක් පත්වීම් ලබා දී නොමැති බව. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |